**සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම - 2020**
----------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතභාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 7.4(අ) ඡේදය ප්‍රකාරව තොග වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුහුණත වෙනම ඉදිරිපත් කළයුතු වුවත්, රු. 174,891 ක් වූ තොග වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුළ වෙනම දක්වා නොතිබුණි | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 7.4(ඇ) ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාමක් ලෙස සැලකිය යුතු රු. 308,700 ක පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 17.8 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එක්ව මිලදී ගත්තද, ඒවා වෙන් කළහැකි වත්කම් වන අතර, ගිණුම්කරණයද වෙන්ව සිදු කළ යුතුය. එහෙත් සමාගමේ රු. 62,631,504 ක පිරිවැය වන ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ අංක 17.19 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාගම සතු පිරිවැය රු. 7,800,562 ක් වූ වාහන 23 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**1.5.3** ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී රු. 9,186,655 ක් වූ වර්ෂ අවසාන ප්‍රාග්ධන පෙළ තොගයද ඇතුළත් කිරීම හේතුවෙන් දළ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් දැනට පාවිච්චි කරමින් පවතින ජෙනරේටරයක පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | මෙම ජෙනරේටරය ප්‍රත්‍යාගණනය කර වත්කම් ලේඛනයට ඉදිරි වර්ෂයේදී ඇතුළත් කරන බව දන්වමි. | -එම- |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු අගයන්හි වෙනස්වීම මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු වුවත්, රු. 4,621,555 ක් මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේ මුළු වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු අගයන්හි වෙනස්වීම රු. 6,611,261 ක් බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | -එම- |
| (ඈ) | විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවීමකින් තොරව සමාගම සතුව පැවතුණු නිරාවිය, තුංකම, කන්තලේ, සිද්ධපුර, හා මුතුවැල්ල යන ගොවිපලවල් 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ මහවැලි අධිකාරිය වෙත පවරා තිබුණද, එම ගොවිපලවල් සතු පිරිවැය රු. 25,073,083 ක් වූ ගොඩනැගිලි හා සවි කිරීම් 164 ක්, වාහන 26 ක්, කාර්යාල උපකරණ 45 ක්, යන්ත්‍රෝපකරණ හා ජෙනරේටර් 66 ක් හා ලී බඩු හා සවිකිරීම් 260 ක් තවදුරටත් සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. එම වත්කම්වලට අදාල වාර්ෂික ක්ෂය රු. 1,873,629 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, ඒවායේ භෞතික පැවැත්ම පිළිබඳ සත්‍යාපනයන් | සමාගමේ පාලනයෙන් ඉවත්වූ ගොවිපලවල් සතු වත්කම් සමාගම සතුව නොමැති වන අතර, සමාගම විසින් පරිහරණය නොකරන බැවින්, එම වත්කම්වලින් සමාගමේ කාර්යයන්ට දායකත්වයක් නොවන බැවින්, එම වත්කම්වලට අදාළව ක්ෂය කිරීම් සිදුකර නැත. මෙම වත්කම් නැවත මහවැලි අධිකාරිය වෙත පවරාදීමට අදාලව තොරතුරු වාර්තා කර | වත්කම් නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

| | |
|---|---|
| මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් සිදුකර නොතිබීම හේතුවෙන් එම වත්කම්වල භෞතික පැවැත්ම විගණනයේදී තහවුරු නොවුණි. | ඇති අතර, මේ වනතෙක් උපදෙස් ලැබී නොමැත. මහවැලි අධිකාරියෙන් ලබාදෙන උපදෙස් මත එම වත්කම් පවරාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**1.5.4 අවිනිශ්චිත ගිණුම**

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ණයගැති ශේෂ යටතේ රු. 3,512,504 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් දක්වා තිබුණු අතර, ඉන් රු.2,047,972 ක ශේෂ 2017 වර්ෂයේ සිට පැවත එන බව නිරීක්ෂණය විය. | 3,512,504 | වසර 03 | මෙම ශේෂයට අදාළ තොරතුරු විශ්ලේෂණය කර ගැනීම දුෂ්කරවී ඇත. ඉදිරි වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | <u>පොදු සංචිතය</u> | | | | |
| (i) | මහවැලි ආර්ථික ඒජන්සිය | 403,918,731 | වටිනාකම සනාථ කර ගත හැකි සාක්ෂි | මෙම ශේෂයන් පශු සම්පත් සංවර්ධන අංශය ලෙස පැවති සමයේ කරන ලද ආයෝජනයන් වේ. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු |
| (ii) | කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | | | |
| (iii) | යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට අදාල ලියවිලි | මෙම ආයෝජනයන් පශු සම්පත් සංවර්ධන අංශය සමාගමක් බවට පත් වූ පසු සමාගමේ ප්‍රාග්ධනය බවට පරිවර්තනය වියයුතු වුවත්, මහවැලි අධිකාරිය සමාගම් කොටස් නිකුත් කිරීමක් සිදුවී නොමැති මෙම ශේෂයන් දිගින් දිගටම පශු සම්පත් | සැලැස්විය යුතු අතර, නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (iv) | විදේශ ආධාර | 5,729,782 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සංවර්ධන අංශයේ ගිණුම්වල තිබූ නම්වලින්ම පවතී. එම නිසා මෙම ශේෂයන්ට අදාල ලේඛන සමාගම සතුව නොමැත. | |
| (ආ) | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 285,185 | ශේෂ තහවුරු කිරීම් හා බදු සහතික පත්‍ර | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු හා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මෙම ලිපිගොනු අක්‍රීය තත්ත්වයේ පවතී. මෙම ශේෂයන් ලියාහැරිය යුතුව ඇත. | -එම- |
| (ඇ) | ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | 2,991,095 | | | |
| (ඈ) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ශේෂය | 165,600 | ශේෂ තහවුරු කිරීම් | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ශේෂය 2003 වර්ෂයේ සිට ඉදිරියට එන ශේෂයකි. මෙය ලියා හැරීමට ඉදිරි වර්ෂයේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |
| (ඉ) | ලැබිය යුතු අත්තිකාරම් ශේෂය | 220,092 | ශේෂ තහවුරු කිරීම් | මෙය 2009 වර්ෂය දක්වා සිදුවූ ගනුදෙනු වන අතර, 2009 වර්ෂයේ සිට ශේෂයන් ඉදිරියට පවතී. | -එම- |
| (ඊ) | දම්මින්න අන්තර් ගොවිපල ශේෂය | 818,177 | ශේෂ තහවුරු කිරීම් | මෙය ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණු නිරාවිය ගොවිපල සතුව තිබුණු රු. 5,820,430 ක් වූ පශු සම්පත් තොගය සඳහා ලැබිය යුතු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අයකර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙම ශේෂය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "එච්" කලාපයේ මූල්‍ය ප්‍රකාශන අනුව මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමේ ණයහිමි ශේෂය රු. 5,373,970 ක් වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති ශේෂය රු. 5,820,430 ක් විය. ඒ අනුව රු. 446,460 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම රු. 446,460 ක ශේෂය "එච්" කලාපය වෙත ගොවිපල භාරදීමේදී ගොවිපල සතුව පැවති නිෂ්පාදන අමුද්‍රව්‍ය හා නිෂ්පාදනවල වටිනාකම වේ. | ශේෂ නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී සිදුකළ වැටුප් සංශෝධනයට අනුව සේවකයින්ට ගෙවිය යුතු රු. 6,893,711 ක හිඟ වැටුප්ද, 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිභාර අරමුදලට ගෙවිය යුතු රු. 18,927,439 ක් සහ රු. 611,083 ක දායක මුදලක්ද ගෙවා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සේවා නියුක්තිභාර අරමුදලට අධිභාර ලෙස රු. 11,830 ක් ගෙවා තිබුණි. | ඉදිරි වර්ෂයේදී කොටස් වශයෙන් ගෙවීම ආරම්භ කරන බව දන්වා සිටිමි. | ගෙවිය යුතු මුදල් ගෙවීමට නොපමාව පියවර ගත යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,793,005 ක පාඩුවක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 4,663,530 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,129,475 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාගමේ ව්‍යාපාර කටයුතු ප්‍රතිසංවිධානය නොකිරීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විතවී තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2020 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි. නිකුත් කර තිබූ කොටස් 03 ම වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත ලබාදී තිබුණු අතර, මහවැලි අධිකාරියේ හිමිකාරීත්වය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණි. | නිකුත් කර ඇති කොටස් තුන නැවත සමාගම වෙත පවරා ගැනීමට ඉදිරි වර්ෂයේදී කටයුතු කරන බව දන්වා සිටින අතර, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හිමිකාරීත්වය වෙනුවෙන් කොටස් නිකුත් කිරීමට මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කර කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත කොටස් නිකුත් කිරීමට කටයුතු කළයුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද, සමාගමේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව ඌරන් කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි. | සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇති කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම සතුව ප්‍රාග්ධන හැකියාවක් නොමැති බැවින්, ඒ සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය කරන පසුබිම සකස් කර ඇත. මෙය ක්‍රියාත්මක වූ පසු එම කාර්යයන් ඉටුකිරීමට කටයුතු කරන බව දන්වමි. | සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රු. 3,162,812 ක් වූ වාහන 04 ක් හා සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටි මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු. 14,929,159 ක් ලෙස දක්වා තිබුණද, එම වත්කම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙය ඉදිරි වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | වත්කම් නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පශු සම්පත් අංශයේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රියාකාරකම් යටතේ ඉලක්කගත නිෂ්පාදනය තත්‍ය නිෂ්පාදනය සමඟ සංසන්දනය කිරීමේදී බොයිලර් කුකුල් මස් නිෂ්පාදනය සියයට **44** ක් ද, ඌරු මස් නිෂ්පාදනය සියයට **3** ක්ද, එළුවන් ඇති කිරීම සියයට **10** ක් ද, මී හරක් ඇති කිරීම සියයට **6** ක් ද වශයෙන් අඩු අගයක් ගෙන තිබුණි. | සත්ව නිෂ්පාදන අංශය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කළයුතුව ඇත. ශීතාගාර පහසුකම් නොමැති බැවින් මස් නිෂ්පාදනය ඉතා අඩු අගයක පවතී. මෙම ගැටලු නිරාකරණය කර ගැනීමට රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කළපසු කරන බව දන්වමි. | ඉලක්ගත ගත නිෂ්පාදනය ලඟාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඈ) | ගිරාදුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටි කිරි සැකසුම්හල ආරම්භ කරන ලද **1986** වර්ෂයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මඟින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරන අතර, කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ බිම ටයිල් කැඩී ගොස් තිබීම, වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලා තුළට කාන්දුවීම, කානු පද්ධතිය අබලන්වීම හා අභ්‍යන්තර පිරිසිදු කිරීමේ පද්ධතිය දුර්වලව පැවතීම ආදී කරුණු නිසා නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගැටළු පැන නැඟී තිබුණි. | නිෂ්පාදනාගාරය අලුතින්ම ඉදිකිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ආයෝජන වාර්තාවේ දක්වා ඇත. මෙම ගිවිසුම ක්‍රියාත්මක වූ පසු මෙම කාර්යය සිදුවන බව දන්වමි. | නිෂ්පාදනයේදී සෞඛ්‍ය ආරක්ෂිත ගැටලු ඇතිවීමට තුඩු දෙන හේතූන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඉ) | **2020/21** මහ කන්නයේ බඩ ඉරිඟු වගාව සඳහා සමාගමේ ඉඩම් කන්න බදු ක්‍රමය යටතේ ගොවීන්ට ලබාදීමේදී ගොවීන් තෝරා ගැනීම සහ බදු මුදල් තීරණය කිරීම කමිටුවක් මඟින් සිදු කළයුතු අතර, මෙමඟින් ලබාගන්නා බදු මුදල් ආදායම මස් ගබඩා කිරීම සඳහා ශීතාගාර කන්ටේනරයක් මිලදී ගැනීමටත්, බ්‍රොයිලර් කොටු අළුත්වැඩියා කරගැනීමටත් යෙදවීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද ගොවියන් තෝරා ගැනීම හා බදු මුදල් තීරණය කිරීම උක්ත කමිටුව මඟින් සිදුකර නොතිබුණ අතර, උපයන ලද මුදල විගණිත දින වනවිටත් සමාගමේ ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම බදු මුදල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් හෙක්ටයාර එකක් සඳහා රු. **1,000** ක් අයකළ අතර, පසුව අය කිරීමකින් තොරවද ලබාදෙන ලදී. එසේ වූවද අප සමාගමක් වශයෙන් ලබාදිය හැකි උපරිම මිලට මෙම ඉඩම් ලබාදීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. (බඩඉරිඟු වගාව සඳහා අක්කරයක් රු. **5,000** ක මුදලකට ද, වී වගාව සඳහා අක්කරයක් රු. **8,200** ක මුදලකටද ලබාදෙන ලදී.) | ගොවීන් තෝරා ගැනීම හා බදු මුදල් තීරණය කිරීම අදාල චක්‍රලේඛ ප්‍රකාරව කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1986 වර්ෂයේ ඉදිකර තිබූ ගිරාදුරුකෝට්ටේ සත්ව ගොවිපලට අයත් ගොඩනැගිලි 57 ක් 2019 වර්ෂයේදී නැවත තක්සේරු කර ගිණුම්වලට ගෙන තිබුණද, මින් ගොඩනැගිලි 7 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පවතින හෙයින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අබලන් තත්ත්වයේ ඇති ගොඩනැගිලි හත ඉදිරියේදී ලියාහැරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | සමාගම සතු ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී රු. 12,501,900 ක් වැය කර ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු. 8,967,600 කට අගය කර 2016 පෙබරවාරි 08 දින සමාගමට පවරා දී තිබුණි. මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | "සී" කලාපය මඟින් ඉදිකරන ලද පුහුණු මධ්‍යස්ථානය සමාගම වෙත පැවරුවද, මේ සඳහා සතුන් මිලදී ගැනීමට සමාගමට ප්‍රාග්ධන හැකියාවක් නොමැත. එම නිසා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය ආරම්භ වූ පසු මේ සඳහා සතුන් මිලදී ගෙන මෙම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගන්නා බව දන්වා සිටිමි. | මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමවේද සකසා ගතයුතුය. |